www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සාමය පිලිබඳ කතාබහ නො තකා ශ්‍රී ලාංකික මිලිටරිය ආක්‍රමනය දිගට ම ගෙන යයි

## Despite talk of peace, Sri Lankan military continues offensive

**කේ. රත්නායක විසිනි**
**2006 ඔක්තෝබර් 05**

ඔක්තෝබර් 28-30 දිනවල දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග "කොන්දේසි විරහිත" සාකච්ඡා පවත්වන බවට ඊයේ ශ්‍රී ලංකාන්ඩුව තාවකාලිකව එකඟ වූ නමුත් කැරලිකරුවන් සිටින ස්ථානවලට එල්ල කරන ප්‍රහාර නැවැත්වීම පිලිබඳව ඉදිරිපත් කෙරෙන කවර හෝ අදහසක් වුව එය බැහැර කලේ ය. එල්ටීටීඊය "ජාතික ආරක්ෂාවට" තර්ජනය කල හොත් ආන්ඩුව ඊට "සුදුසු ලෙස ප්‍රතිචාර දක්වන" බවට ආරක්ෂක කටයුතු පිලිබඳ ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල අනතුරු ඇඟවී ය.

සාකච්ඡා පිලිබඳ එකඟතාව ඇති කරනු සඳහා අතරමැදියා ලෙස කටයුතු කර ඇත්තේ ඉරිදා කොලඹට ලඟා වූ නෝර්වේජියානු නියෝජිත ජොන් හැන්සන් බ්වර් ය. එල්ටීටීඊ නායකයන් සමග සාකච්ඡා පැවැත්වීම සඳහා අඟහරුවාදා කිලිනොච්චියට සංචාරය කිරීමට පෙර සඳුදා ඔහු ආන්ඩුවේ ප්‍රධාන සාකච්ඡාකරු වන නිමල් සිරිපාල ද සිල්වා හා අනෙකුත් ඇමතිවරුන් සමග සාකච්ඡා පැවැත්වී ය. එල්ටීටීඊය සාකච්ඡාවලට එකඟ වී ඇති නමුත් හමුදාව තමන් සිටින ස්ථානවලට දිගින් දිගට ම ප්‍රහාර එල්ල කල හොත් ඉන් ඉවත් වන බව එල්ටීටීඊයේ ප්‍රකාශක දයා මාස්ටර් කියා සිටියේ ය.

එල්ටීටීඊයට පක්ෂපාතී *ටැමිල්නෙට්* වෙබ් අඩවියට අනුව එල්ටීටීඊයේ දේශපාලන අංශ නායක එස්.පී. තමිල්චෙල්වම් හැන්සන් බවර්ට මෙසේ කී යː "කොලඹ ඒක-පාර්ශ්වික ආක්‍රමනයක් කර ගෙන යනවා. ශ්‍රී ලංකාවේ පැත්තෙන් අභිවෘද්ධියක් පිලිබඳ විශ්වසනීය සංඥාවක් දකින්න නැහැ." එමෙන් ම ශ්‍රී ලංකාවේ උතුරේ වෙසෙන ලක්ෂ සංඛ්‍යාත ජනයාට අවශ්‍ය ආහාර හා අනෙකුත් මූලික සැපයුම් කපා හරිමින් ඒ 9 ප්‍රධාන මාර්ගය වසා දැමීම සම්බන්ධයෙන් ද එල්ටීටීඊය උත්සුකතා මතු කලේ ය.

හැන්සන් බවර් හා තමිල්චෙල්වම් අතර සාකච්ඡා සිදු වෙමින් පවතින අතරවාරයේ මිලිටරි ජෙට් යානා ඉන් යන්තම් කිලෝමීටර 30ක් නුදුරින් පූනරින්හි එල්ටීටීඊ මධ්‍යස්ථානවලට ප්‍රහාර එල්ල කලේ ය. මිලිටරිය සිය ක්‍රියාවන් ගැන කනගාටුව ප්‍රකාශ නොකලේ, ඒවා එල්ටීටීඊය එල්ල කල මෝටාර් හා කාල තුවක්කු ප්‍රහාරයකට දැක්වූ ප්‍රතිචාරයක් යැයි කියාපාමිනි. කෙසේ වුව ද, ප්‍රහාරවල සැබෑ අරමුන වූයේ මිලිටරි ආක්‍රමනය අඛන්ඩව සිදු වන බවටත් කවර හෝ සාකච්ඡාවක් පැවැත්වෙන්නේ ආන්ඩුවේ කොන්දේසි මත බවටත් එල්ටීටීඊයට හා නෝර්වේ රාජ්‍යයට සංඥාවක් යැවීම යි.

සාකච්ඡාවල අන්තර්ගතය ගැන කෙසේ වෙතත් සාකච්ඡා පැවැත්වෙන්නේ කොතැනක දී ද යන්න සම්බන්ධයෙන් වත් කිසිදු එකඟතාවකට පැමින නැත. සාකච්ඡා ජිනීවාහි පැවැත්විය යුතු යැයි ආන්ඩුව බලපෑම් කරන මුත් එල්ටීටීඊය නෝර්වේජියානු අගනුවර වන ඔස්ලෝව යෝජනා කර තිබේ. මතභේදය නොවැදගත් වන්නක් නො වේ. සාම ක්‍රියාවලියේ නිල පහසුකම් සපයන්නා වන නෝර්වේ රාජ්‍යය "එල්ටීටීඊයට පක්ෂපාතී" යැයි යලි යලිත් චෝදනා කර ඇති සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සිය සන්ධාන මිතුරන්ගෙන් එල්ල වන පීඩනයට ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මුහුන දී සිටී.

හැන්සන් බවර්ගේ සංචාරය සිදු වූයේ මිලිටරිමය ක්‍රියාවන් නතර කොට සාකච්ඡා සඳහා එලඹෙන ලෙස ශ්‍රී ලංකාවට ආධාර දෙන කන්ඩායමේ සමසභාපතිවරුන් -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය හා නෝර්වේ -- පසු ගිය මාසයේ කල කැඳවුමකින් අනතුරුව ය. කොලඹ පාලනය "කොන්දේසි විරහිත සාකච්ඡාවන්ට" එකඟ වූ බව කියමින් සමසභාපතිවරුන් "නොමග යැවීම" පිලිබඳවත් කවර හෝ සාකච්ඡාවක් පැවැත්වෙන කාලය හා ස්ථානය ගැන තමන්ගෙන් අදහස් විමසීමට අසමත් වීම පිලිබඳවත් රාජපක්ෂ ආන්ඩුව වහා ම නෝර්වේ රාජ්‍යය හෙලා දිටී ය.

එවක් පටන්, කවර ප්‍රචන්ඩ ක්‍රියාවක් හෝ සිදු කිරීමෙන් වැලකී සිටින බවට එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන්ගෙන් ලිඛිත පොරොන්දුවක් ඉල්ලා සිටීම ඇතුලුව දීර්ඝ

කොන්දේසි ලැයිස්තුවක් පිලිබඳව ආන්ඩුවේ නිලධාරීන් අවධාරනය කර තිබේ. ආන්ඩුව සුවිශේෂ කොන්දේසි පැනවීමෙන් අඩිය පස්සට ගෙන ඇත ද එල්ටීටීඊයට එරෙහිව "සුදුසු ප්‍රතිපියවරයන්" ගැනීමට ඇති අයිතිය පිලිබඳව එය කරන අවධාරනය සාකච්ඡාවන්ට ඉහලින් පැතිර පවත්නා ඝන අඳුරු වලාවක් වැනි ය. ආන්ඩුව පසු ගිය ජූලි මස පටන් එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීම පිනිස ගෙන ගිය සිය සියලු ම ආක්‍රමන ප්‍රහාර දියත් කලේ "ආරක්ෂක" හා "මානුෂීය" ක්‍රියාවන්ගේ වේශයෙනි.

ජවිපෙ කවර හෝ සාකච්ඡාවක් ඇති වීම වැලැක්වීම හා යුද්ධය සඳහා පීඩනය යෙදීම පිනිස සිය උද්ඝෝෂනය තීව්‍ර කර ඇත. මිලිටරිය සිය ආක්‍රමනය නතර නො කල යුතු යැයි ද නෝර්වේ රාජ්‍යය පහසුකම් සපයන්නාගේ තත්ත්වයෙන් ඉවත් කල යුතු යැයි හා ආන්ඩුව සටන් විරාමය ඉරා දැමිය යුතු යැයි ද ජවිපෙ, ජාතික හෙල උරුමය (ජාහෙඋ) හා අනෙකුත් සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් ඉල්ලා සිටිති. ඊයේ කොලඹ දී පවත්වන ලද විරෝධතාවක් සමගින් ජවිපෙ නව " මව්බිම සුරැකීමේ ව්‍යාපාරයක්" දියත් කලේ ය. එනමුත් ඒ සඳහා පැමින සිටියේ 5,000ක පමන සුලු ජනකායක් ය යන කරුන යුද්ධය කෙරෙහි පුලුල්ව පැතිර පවතින විරුද්ධත්වයේ සංඥාවක් වන්නේ ය.

ශ්‍රී ලාංකික මිලිටරියේ සිතැඟි පිලිබඳව අදහස් දක්වමින් *රොයිටර්* ප්‍රවෘත්ති සේවය සඳුදා මෙසේ වාර්තා කලේ යඃ "ත්‍රිකුනාමලයේ ඇති ඊසානදිග වරායට දකුනින් පිහිටි මූලෝපායාත්මකව වැදගත් කැරලිකරුවන්ගේ භූමි ප්‍රදේශ අල්ලා ගැනීම මගින් දිරිමත් වූ මිලිටරියේ ඇතැම් නිලධාරීන් කියන්නේ කවර හෝ සාකච්ඡාවක් ඇති වීමට පෙර කොටින්ට හැකි තරම් හානි පැමිනවීම සඳහා තමන් උනන්දු වන බව යි." අඟහරුවාදා පැවති මාධ්‍ය හමුවක දී එයාර් මාර්ෂල් ඩොනල්ඩ් පෙරේරා එම අදහස ම ප්‍රකාශයට පත් කරමින්, "ගැටුම සංවාදයෙන් විසඳ ගන්න ඕන තමයි. ඒත් කැරලිකරුවන්ගේ ප්‍රහාරවලට එදිරිව සිදු කරන මිලිටරි ක්‍රියාවන් කිසි සේත් ලිහිල් කරන්නේ නැහැ" යි අනතුරු ඇඟවී ය.

සාකච්ඡා පිලිබඳව කතාබහ සිදු වෙමින් පවතින තත්ත්වය යටතේ පවා මිලිටරිය එල්ටීටීඊ මධ්‍යස්ථානවලට දිනපතා ප්‍රහාර එල්ල කර තිබේ.

● සැප්තැම්බර් 25 දා, පුල්මුඩේ ආසන්නයේ නැගෙනහිර වෙරල තීරයෙන් ඔබ්බෙහි ඇති වූ නාවික ගැටුමක දී එල්ටීටීඊ යාත්‍රා 11ක් ගිල්වා දැමූ බවට නාවික හමුදාව කියාපෑවේ ය.

● සැප්තැම්බර් 26 දා, ගුවන් හමුදාවේ ජෙට් යානා මන්නාරමේ වෙල්ලන්කුලම්හි පිහිටි එල්ටීටීඊ "මුහුදු කොටි" පුහුනු කඳවුරක් යැයි කියන ලද ස්ථානයකට බෝම්බ හෙලා එය විනාශ කර දැමී ය.

● සැප්තැම්බර් 27 දා, මිලිටරි මාධ්‍ය ප්‍රකාශකයෙකු සඳහන් කල පරිදි ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා ත්‍රිකුනාමලය ආසන්නයේ කඩ්ඩවාන් කැලයෙහි පිහිටි එල්ටීටීඊයේ ප්‍රධාන පුහුනු කඳවුරක් විනාශ කොට එල්ටීටීඊ සටන්කරුවන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කලේ ය.

● සැප්තැම්බර් 27 දා, ගුවන් හමුදාවේ ජෙට් යානා මුලතිව්හි පුදුකුඩිරුප්පු ප්‍රදේශයේ පිහිටි එල්ටීටීඊයේ " අතරමැදි කඳවුරුවලට හා අතරමැදි මධ්‍යස්ථානවලට" බෝම්බ හෙලී ය.

● සැප්තැම්බර් 29 දා, එල්ටීටීඊ සටන්කරුවන් 12 දෙනෙකු ඝාතනය කරමින් විශේෂ කාර්ය බලකායේ (එස්ටීඑෆ්) පොලිස් කොමාන්ඩෝ භටයෝ මඩකලපු දිස්ත්‍රික්කයෙහි පිහිටි පිල්ලුමලේ ප්‍රදේශයට ප්‍රහාර එල්ල කලහ. එල්ටීටීඊ සටන්කරුවන් ඝාතනය කලේ ඔවුන් එස්ටීඑෆ් කඳවුරකට පහර දීම සඳහා සූදානම් වෙමින් සිටිය දී යැයි මිලිටරිය කියාපෑව ද ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) අනාවරනය කර ගත්තේ ගැටුම සිදු වී ඇත්තේ එල්ටීටීඊයට අයත් භූමි ප්‍රදේශය තුල ම එහි සීමාවෙන් කිලෝමීටරයක් ඇතුලට වන්නට පිහිටි ස්ථානයක දී බව යි. "ආරක්ෂක හේතුන්" ගෙන හැර පාමින් එස්ටීඑෆ් බලකාය තම කඳවුර තුල ප්‍රශ්න කිරීම් සිදු කිරීමෙන් සටන් විරාම නිරීක්ෂන කමිටුව වලක්වා ඇත.

සැප්තැම්බර් 24 වන දා, නිල වශයෙන් 2002 සටන් විරාමය නිරීක්ෂනය කරන සටන් විරාම නිරීක්ෂන කමිටුව දෙපාර්ශ්වය ම සිදු කරන ප්‍රචන්ඩකාරී ක්‍රියා " බිය දනවන සුලු" යැයි විස්තර කල වාර්තාවක් නිකුත් කලේ ය. දෙසැම්බරයේ පටන් මේ දක්වා මිලිටරිමය ගැටුම් නිසා සිවිල් වැසියන් 200ක් ද ඇතුලු 1,500කට ආසන්න ජනයා මිය ගොස් තිබේ. නැගෙනහිර පලාතේ මඩකලපු නගරය තුල වී. මුරලිදරන් හෙවත් කරුනා නායකත්වය දෙන එල්ටීටීඊයෙන් කැඩී ගිය කන්ඩායම කර ගෙන යන ක්‍රියාකාරකම් පිලිබඳව ද වාර්තාව උත්සුකතා මතු කලේ ය.

ආන්ඩුව ප්‍රතික්ෂේප කරන නමුදු පැහැර ගෙන යාම් හා ඝාතන සිදු කිරීමේ දී කරුනා කන්ඩායම විවෘතව ම මිලිටරියේ සහායකයෙකු ලෙස ක්‍රියා කරයි. "කරුනා කන්ඩායම දැන් ජනයාට හිරිහැර කරමින් නිදහසේ මඩකලපු නගරයේ හාත්පස ඇවිදිමින් සිටින අතර අයිසීආර්සී ( ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ) කාර්යාලයට මීටර 20ක් පමන නුදුරේ දී කරුනා කන්ඩායමේ සාමාජිකයෙකු හිසට තුවක්කුව තබා අයිසීආර්සීහි ජාතික කාර්ය මන්ඩල සාමාජිකයෙකුට

තර්ජනය කර තිබේ. මෙය ප්‍රදේශයේ ජනතාව හමුවේ වැඩෙන ගැටලුවක් බවට පත් වෙමින් පවතී," යැයි වාර්තාව ප්‍රකාශ කලේ ය.

දෙපාර්ශ්වයට ම දොස් නැගීම පිලිබඳවත් ඒ මගින් " ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා පත් කර ගන්නා ලද ආන්ඩුව" හා "ත්‍රස්තවාදී එල්ටීටීඊය" සමාන කිරීම පිලිබඳවත් ආරක්ෂක කටයුතු පිලිබඳ ප්‍රකාශක රඹුක්වැල්ල ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ වාර්තාවා තදින් පහර එල්ල කලේ ය. යථා වශයෙන් ගත් විට, ප්‍රදේශයේ ජනතාව ත්‍රස්ත කිරීමට දරන ප්‍රයත්නයේ දී මිලිටරිය හා කරුනා කන්ඩායම වැනි එහි සහායකයන් දාමරික ක්‍රියා මාලාවක් සිදු කර තිබේ. රඹුක්වැල්ලගේ ප්‍රකාශ ආන්ඩුවේ ආක්‍රමනකාරී ආස්ථානයත් එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීම හා සැලකිය යුතු මට්ටමකින් එහි සටන් හැකියාව දුර්වල කිරීම අරමුනු කර ගෙන සිදු කරන මිලිටරි මෙහෙයුම් ඉදිරියට ගෙන යනු වස් ඊට පවතින අභිප්‍රායත් පිලිබඳ සලකුනකි.

ප්‍රසිද්ධියේ සාමය ඉල්ලා සිටින අතරවාරයේ එක්සත් ජනපදය හා අනෙකුත් ප්‍රධාන බලවතුන් ආක්‍රමනික මෙහෙයුම් ඉදිරියට ගෙන යාම පිනිස රාජපක්ෂට නිහඬව දිරි දී තිබේ. "ප්‍රචන්ඩත්වය අත හැර," එනම් ඒක-පාර්ශ්විකව නිරායුධ වී ආන්ඩුවේ කොන්දේසි මත සාකච්ඡාවලට එලඹීමට එකඟ නොවන්නේ නම් එල්ටීටීඊය "වඩා ශක්ති සම්පන්න වූ මිලිටරියකට" මුහුන දෙනු ඇති බවට වසර මුල දී බුෂ් පරිපාලනය අනතුරු ඇඟවී ය. මේ වසරේ දී, එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" යැයි නම් කොට තහනම් කරන ලෙස එක්සත් ජනපදය කැනඩාවට හා යුරෝපා සංගමයට පීඩනය යෙදී ය. එමගින් ජාත්‍යන්තරව පිටුවාහලේ වෙසෙන දෙමල ජනතාවගෙන් එල්ටීටීඊයට ලැබෙන සැලකිය යුතු මූල්‍යමය හා දේශපාලනික සහාය කපා හරින ලදි.

ශ්‍රී ලංකාවේ නව එක්සත් ජනපද තානාපති රොබට් ඕ. බ්ලේක් සැප්තැම්බර් 19 දා පැවති මාධ්‍ය හමුවක දී කියා සිටියේ එක්සත් ජනපදය "ත්‍රස්තවාදයට මුහුන දීම සඳහා ශ්‍රී ලාංකික මිලිටරියට උදව් කරමින් සිටින" බව යි. එල්ටීටීඊය "වචනයෙන් මෙන් ම ක්‍රියාවෙන් ද ත්‍රස්තවාදය හා ප්‍රචන්ඩත්වය අත් හල යුතු ය" යන ඉල්ලීම හේ යලි යලිත් ඉදිරිපත් කලේ ය. රාජපක්ෂ ආන්ඩුව දැන් ශ්‍රී ලාංකික මහජනතාවට විනාශකාරී ප්‍රතිවිපාක අත් කර දෙමින් තමන්ගේ ම "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ගෙන යමින් සිටින්නේ ය යන්න පුදුමයක් නො වේ.

© www.wsws.org